**රත්නපුර ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් කල කර්මාන්ත 03 කට අදාලව සභාව වෙත ලැබිය යුතු එකතුව රු. 1,094,758 ක් සඳහා ණයගැති වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | අදාල ගැලපීම් සිදුකර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ගිලීමලේ ජල යෝජනා ක්‍රමය වෙනුවෙන් ලැබිය යුතු රු. 1,995,000 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | අදාල ගැලපීම් සිදුකර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු රු. 36,600 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් මිලට ගැනීම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | ගිණුම් විෂයයන් 02 ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 6,035,322 ක වෙනසක් විය. | වෙනසට හේතු සොයාබලා ගිණුම් යාවත්කාලීන කළ යුතුවේ. | මෙම ලේඛන දෙකෙහි ශේෂයන් දිගුකාලීනව වෙනස්කම් පවතින ශේෂයන් වේ. ඉදිරියේදී පෙර වර්ෂවල වෙනස්කම් සොයා යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 2005 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අවස්ථා 16 කදී ලබාදී තිබූ එකතුව රු. 463,245 ක් වූ අතුරු අග්‍රිම පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම අත්තිකාරම් පිළිබඳව සොයා බලා අදාළ පුද්ගලයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,913,203 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,676,436 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම - | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,191,240 | 1,329,515 | 1,316,043 | 69,496 | 157,840 | 837,043 | 847,136 | 60,457 |
| (ii) | කුලී | 481,400 | 46,800 | 46,800 | - | 455,000 | 96,678 | 96,678 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 706,650 | 634,600 | 634,600 | - | 690,200 | 1,007,875 | 1,007,875 | 182,780 |
| (iv) | වෙනත් ආදායම් | 19,598,000 | 21,630,338 | 37,833,060 | 18,391,992 | 27,347,500 | 17,151,122 | 10,737,057 | 30,969,407 |

## 2.2.2 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 16 දින වනවිට ව්‍යාපාරික ආයතන 368 ක් ගාස්තු ගෙවා වෙළඳ බලපත්‍ර ලබා ගැනීමට අයදුම් කර තිබුණි. ඒ සඳහා අවශ්‍ය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ නිර්දේශය ලබා ගැනීමට අයදුම්පත් 148 ක් යොමු කර තිබුණු අතර, නිර්දේශ ප්‍රමාදවීම හේතුවෙන් වෙළඳ බලපත්‍ර 21 ක් පමණක් නිකුත් කර තිබුණි. | සියළුම ආයතන වෙත බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මඟින් ලබාදිය යුතු නිර්දේශ ප්‍රමාද වීම හේතුවෙන් සභාව විසින් නිකුත් කරන වෙළඳ බලපත්‍ර ප්‍රමාණය අඩු වී ඇත. මේ සම්බන්ධයෙන් අදාල නිළධාරීන් දැනුවත් කර ඇති අතර, 2019 ජනවාරි 01 දින සිට ලැබෙන වෙළඳ බලපත්‍ර සියල්ල මේ වනවිටත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත යොමුකර ඇත. |
| (ආ)(i) | 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 17 දරන ජාතික පරිසර පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර/ කර්මාන්ත සම්බන්ධයෙන් නීතිමය කටයුතු කල යුතු වුවත්, එවැනි ආයතන හඳුනා ගැනීම සඳහා වාර්ෂික සමීක්ෂණයක් හෝ වෙනත් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගතයුතු සියළු ආයතන වෙත බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | තනතුරු පුරප්පාඩු වීම මත හා විෂයය භාර නිලධාරී ප්‍රසූත නිවාඩු ලබා තිබූ බැවින් 2018 වර්ෂය වෙනුවෙන් සමීක්ෂණ කටයුතු සිදුකිරීමට නොහැකි විය. |
| (ii) | සභාව වෙත ලැබෙන අයදුම්පත්වලින් බලපත්‍ර 05 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුල නිකුත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තුගත පරිසර බලපත්‍ර ආදායමින් සියයට 90 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. බල ප්‍රදේශය තුල පාරිසරික බලපත්‍ර ලබා ගතයුතු ව්‍යාපාර/ කර්මාන්ත තිබියදී ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබීම හේතුවෙන් සභා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් සභාවේ වගකීම ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගතයුතු සියළු ආයතන වෙත බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | මේ වනවිට පුරප්පාඩු සියල්ල සම්පූර්ණ වී ඇති බැවින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කර ඇත. |

**2.2.3 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුල තිබෙන විදුලි සංදේශන කුළුණු 23 න් හා කුඩා ජල විදුලි බලාගාර 17 න් වාර්ෂිකව අයකල යුතු ව්‍යාපාර බදු අයකර නොතිබීම නිසා වර්ෂයකට රු. 120,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස් කර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභා බල ප්‍රදේශය තුළ විදුලි සංදේශ කුලුණු හා කුඩා ජල විදුලි බලාගාර වලින් ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා මඟින් අවශ්‍ය නීතිමය පසුබිම සකසා ගතයුතු බැවින් මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් පැවැත්වීම, නවනගර ප්‍රධාන කාර්යාල භූමියේ දිරන කසළ එකතු කර කොම්පෝස්ට් නිෂ්පාදනය සහ එම පොහොර භාවිතා කර මල් හා එළවළු වගා කිරීමට සැලසුම් කර තිබුණ ද එම කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඉටු කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2018 වර්ෂයේ අප්‍රේල් මස වන විට නව සභාවක් පත් වූ බැවින් සභා තීරණ අනුව කටයුතු කිරීමේදී මූල්‍ය තත්ත්වය යහපත් නොවීම හේතුවෙන් මෙම කාර්යයන් කිරීමට අපොහොසත් විය. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක නිවැරදිව හඳුනාගනිමින් දිගුකාලීන | සභාව පත්වීමත් සමඟ ආරම්භ කළ මේ ඇරඹුමයි ජංගම වැඩසටහන මඟින් තිරසර සංවර්ධන ඉලක්ක |

| | | |
|---|---|---|
| ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | අරමුණු අනුව වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අනුමත තනතුරු 07 ක පුරප්පාඩු 09 ක් පැවතුණි. | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාවේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් හා ප්‍රධාන ලේකම් වෙත වර්ෂයකට කාර්තු වාර්තා 04 ක් මඟින් දැනුම් දී ඇත. |
| (ආ) | තනතුරු වල අවශ්‍යතාවය තහවුරු කර අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ ගිවිසුම්ගත කාලසීමාව අවසානයේ සේවය අවසන් කිරීමට හෝ කටයුතු නොකර ඇතුලත් වී තිබුණු සේවා ගිවිසුම් අළුත් කරමින් සේවකයින් 11 දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණි. එම සේවකයින් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල සභා අරමුදලින් රු. 2,018,930 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු අතර, සේවා ගිවිසුම් මත බඳවා ගෙන ඇති සේවකයින් පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මෙම තනතුරු සඳහා මුදල් රෙගුලාසි 71 යටතේ නව තනතුරු අනුමත කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත මීට වසර කිහිපයකට පෙර සිට දැනුම් දී ඇත. නමුත් එම තනතුරු සම්බන්ධයෙන් කිසිඳු දැනුම් දීමක් කර නොමැත. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවතින අනවසරඉදිකිරීම් හඳුනාගෙන ඒවා ඉවත් කිරීම හෝ නියමානුකූල කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සභාව අනුගමනය කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම හා ඉදිරි කටයුතු සම්බන්ධයෙන් විධිමත් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ලැබුණු මහජන පැමිණිලි අනුව කාර්මික නිලධාරී මඟින් ලබාදෙන නිර්දේශ පදනම් කොට ගනිමින් ඉවත් කිරීමට හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. |
| 2014 ජුනි 30 දින වනවිට දියුණු ගම් ප්‍රදේශ 06 ක් හඳුනාගෙන තිබුණද, ඊට අදාල ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කර නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම ප්‍රදේශවලින් | සභාව වෙත ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට අදාල කටයුතු අප්‍රමාදව සිදුකළ යුතුවේ. | සභා බල ප්‍රදේශයේ වරිපනම් අයකිරීම සම්බන්ධයෙන් දියුණුගම් ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය අනුමැතිය පළාත් පාලන සහකාර කොමසාරිස් මේ වනවිට ලබා දී ඇති බැවින් එම ප්‍රදේශ ගැසට් කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු ඉදිරි මස සභා තීරණ අනුව සිදු කරමි. |

වරිපනම් අයකර ගැනීමට නොහැකි වීම, සභාවට ලැබෙන ප්‍රධාන ආදායම් මාර්ගයක් අහිමි වීමට හේතුවී තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ වීථි ලාම්පු ලේඛනය යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. | ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුවේ. | වීථි ලාම්පු ලේඛනය යාවත්කාලීනව නඩත්තු කිරීමට විෂයය භාර නිලධාරී දැනුවත් කර ඇති අතර, පසුවිපරම් කිරීමට කටයුතු කරමි. |

**3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු JCB යන්ත්‍රය 2016 වර්ෂයේදී ක්‍රියාවිරහිත වී ඇති අතර, එම යන්ත්‍ර වල මෙරට නියෝජිත ආයතනය විසින් 2016 මැයි 04 දිනැතිව රු. 1,721,277 ක අළුත්වැඩියා ඇස්තමේන්තුවක් ලබා දී තිබුණි. එහෙත් එම වර්ෂයේදී යන්ත්‍රය අළුත්වැඩියා කර නොතිබුණු අතර, 2017 ජූනි වනවිට ඇස්තමේන්තුගත අළුත්වැඩියා වියදම රු. 711,389 කින් වැඩිවී තිබුණි. | නඩත්තු හා අළුත්වැඩියා කටයුතු විධිමත්ව හා ප්‍රමාදයකින් තොරව සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. | සභාවේ මූල්‍ය තත්ත්වය යහපත් නොවීම හේතුවෙන් සභාව සතු JCB යන්ත්‍රය අලුත්වැඩියාවන් සඳහා විශාල මුදලක් වෙන් කිරීම අපහසු විය. හැකි ඉක්මනින් අදාළ යන්ත්‍රය අලුත්වැඩියා කර ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා 2018 මාර්තු මස නියෝජිත ආයතනය වෙත යොමු කර තිබුණද, එය අළුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව සභාපතිවරයා විසින් 2018 අප්‍රේල් මස අදාල ආයතනය වෙත ලිඛිතව දැනුම් දී තිබුණි. යන්ත්‍රය 2018 දෙසැම්බර් 12 දක්වා එම ආයතනය තුල ගාල් කර තිබී ඇති අතර, පරීක්ෂණ හා ප්‍රවාහන ගාස්තු වශයෙන් රු. 42,550 ක නිෂ්ඵල වියදමක් දැරීමට සභාවට සිදුව තිබුණි. | නඩත්තු හා අළුත්වැඩියා කටයුතු විධිමත්ව හා ප්‍රමාදයකින් තොරව සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. | සභාවේ මූල්‍ය තත්ත්වය යහපත් නොවීම හේතුවෙන් සභාව සතු JCB යන්ත්‍රය අලුත්වැඩියාවන් සඳහා විශාල මුදලක් වෙන් කිරීම අපහසු විය. හැකි ඉක්මනින් අදාළ යන්ත්‍රය අලුත්වැඩියා කර ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 ජනවාරි සිට මාර්තු 10 දක්වා කාල සීමාව තුල මෙම යන්ත්‍රය කුලියට දීමෙන් සභාව රු. 308,750 ක ආදායමක් උපයා තිබුණි. යන්ත්‍රය කඩිනමින් අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් සභාවට ආදායම් මාර්ගයක් අහිමි වී තිබූ අතර, අළුත්වැඩියා වියදම තවදුරටත් ඉහල යාමේ අවදානමක් පැවතුණි. | නඩත්තු හා අළුත්වැඩියා කටයුතු විධිමත්ව හා ප්‍රමාදයකින් තොරව සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. | සභාවේ මූල්‍ය තත්ත්වය යහපත් නොවීම හේතුවෙන් සභාව සතු JCB යන්ත්‍රය අලුත්වැඩියාවන් සඳහා විශාල මුදලක් වෙන් කිරීම අපහසු විය. හැකි ඉක්මනින් අදාළ යන්ත්‍රය අලුත්වැඩියා කර ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 3.4.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 03 කට වැඩි කාලයක සිට ධාවන තත්ත්වයේ නොපවතින වාහන 05 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම කළ යුතුවේ. | අදාල වාහන අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරමි. |

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු නමුත් රු. 4,094,280 ක් වටිනා ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | හදිසි අවශ්‍යතාවයන් අනුව මිලදී ගැනීමට සිදුවන බැවින් සභාවේ සියලුම මිලදී ගැනීම් මිල කමිටුවේ නිර්දේශය මත සභා අනුමැතිය අනුව සිදු කරනු ලබයි. සභා අරමුදල සැලකිල්ලට ගෙන අවශ්‍ය භාණ්ඩ අවශ්‍ය පරිදි ප්‍රසම්පාදනය කරන බැවින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම අපහසුය. ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගැනීමට පියවර ගනිමි. |

### 3.5.2 සැපයීම් හා සේවා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලියාපදිංචි වී නොමැති සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා රු. 765,620 ක් වැයකර වීථි ලාම්පු උපකරණ මිලදී ගෙන තිබුණද මෙම ප්‍රසම්පාදනයට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කිරීම හා භාණ්ඩ ලැබීම් හා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුවේ. | සභාව පත්වීමත් සමඟම ආරම්භ කරන ලද සියලුම බල ප්‍රදේශ ආවරණය කරමින් පවත්වනු ලැබූ ජංගම සේවා වැඩ සටහන සඳහා එම බල ප්‍රදේශ වල වීථි ලාම්පු සවිකිරීම ප්‍රමුඛ කාර්යයක් විය. මෙම කාර්යය |

| | | |
|---|---|---|
| නිකුත් කිරීම් තොග පොත් වල සටහන් කිරීම කර නොතිබුණි. | | කඩිනමින් සිදුකළ යුතුව තිබූ බැවින් මීට පෙර මිලදී ගත් ආයතනයෙන්ම මිලදී ගන්නා ලදී. භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් තොග පොත්වල සටහන් කිරීම සම්බන්ධයෙන් පැවති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරගෙන යනු ලබයි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 25 කට අදාලව එකතුව රු. 1,693,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | මෙම වැය විෂයයන්වල වියදම් අවස්ථා මතු නොවීම නිසා සමහරක් වැය ශීර්ෂවල ප්‍රතිපාදන ඉතිරි විය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 18 කට අදාලව එකතුව රු. 91,063,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 96 දක්වා පරාසයක ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | මෙම වැය විෂයයන්වල වියදම් අවස්ථා මතු නොවීම නිසා සමහරක් වැය ශීර්ෂවල ප්‍රතිපාදන ඉතිරි විය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත් කර ඇති බැවින් විගණනය සඳහා ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරමි. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂයේ පළමු කාර්තුවට අදාළ විගණන හා කළමනාකරණ කමිටුව 2019 අප්‍රේල් 10 දින පවත්වා ඇත. |